# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2183/17 – 2020 ජූලි 06 වැනි සඳුදා – 2020.07.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම මෙයින් ප්‍රකාශ කරමි.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩපොල මැදලස්ස කෝරළේ සුළු කොට්ඨාසයේ, අංක 907, වලගම්මුල්ල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, හඳුගල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක Ku/PLG/2019/015 හා 2019.04.24 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර ‘A’** – වැකුඹුරේහේන සහ පාරඅද්දරහේන – **ප්‍රමාණය: හෙක්. 0.0522 ක් පමණ**

උතුරට: බී. ආර්. කේ. බී. බස්නායක හිමිකම් කියන ගලඋඩකොඹේවත්ත, ඩබ්ලිව්. ඒ. දයාරත්න හිමිකම් කියන වැකුඹුරේහේන සහ ඒ. නිමල් හිමිකම් කියන වැකුඹුරේහේන; නැගෙනහිරට: ඒ. නිමල් හිමිකම් කියන වැකුඹුරේහේන සහ කැබලි අක්ෂර B; දකුණට: කැබලි අක්ෂර B සහ මාර්ග සංවර්ධන අධිකාරියේ මාර්ගය; බටහිරට: මාර්ග සංවර්ධන අධිකාරියේ මාර්ගය සහ බී. ආර්. කේ. බී. බස්නායක හිමිකම් කියන ගලඋඩකොඹේවත්ත.

02. **කැබලි අක්ෂර ‘B’** – වැකුඹුරේහේන සහ පාරඅද්දරහේන – **ප්‍රමාණය: හෙක්. 0.0522 ක් පමණ**

උතුරට: ඒ. නිමල් හිමිකම් කියන වැකුඹුරේහේන සහ එස්. එම්. ධර්මරත්න හිමිකම් කියන වැකුඹුරේහේන; නැගෙනහිරට: එම්. ඒ. එමලිනෝනා හිමිකම් කියන වැවේවත්ත; දකුණට: මාර්ග සංවර්ධන අධිකාරියේ මාර්ගය; බටහිරට: කැබලි අක්ෂර A.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: 4-3/18/2018/WS/388.
2020 මාර්තු මස 12 වැනි දින.
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

07 – 544

---

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම මෙයින් ප්‍රකාශ කරමි.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගඟවට කෝරළේ සුළු කොට්ඨාසයේ, මහකන්ද (268) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මහකන්ද ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක Maha/MHN/2017/350 හා 2017.12.31 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – මහකන්ද වත්ත – ප්‍රමාණය: හෙක්. 0.0038 ක් පමණ**

උතුරට, නැගෙනහිරට සහ දකුණට: පී. ජී. එන්. ඒ. පතිරණ හිමිකම් කියන මහකන්ද වත්ත; බටහිරට: මාර්ගය.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: 4-3/9/2015/WS/118.
2020 මාර්තු මස 12 වැනි දින.
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

07 – 545

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.